කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment
හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No.: MFE/DEV/HOB/03/vol ii
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2022.09. 09

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 02/2022 (I)

**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන්හට බලපත්‍ර ලබා දීමට අදාලව 2022.08.31. දින නිකුත් කරනු ලැබූ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022 හි පහත සඳහන් වගන්ති මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

**වගන්තිය 4 -කොන්දේසි**

**(1)** මෙහි **4.3** උප වගන්තිය අවසානයෙහි පහත යෙදුමද ඇතුලත් කරනු ලැබේ.
"කෙසේ වෙතත්, ලියාපදිංචියෙන් වසර 2ක් ඉක්මවා යාමට පෙර වාහනය තෙවන පාර්ශවයකට පවරනුයේ නම් එහිදී පැවරීමේ බදු ලෙස වාහනයේ CIF වටිනාකමෙන් 10%ක් අදාල වන අතර එය ඇමෙරිකානු ඩොලර් වලින් ගෙවීමට කටයුතු කළ යුතුය".

**(2)** මෙහි **4.4** උප වගන්තියේ ඇතුලත් ආනයනය කළ හැකි වාහනයේ උපරිම CIF වටිනාකම ඉවත් කරන අතර ඒ අනුව බලපත්‍ර ලබා දීමට අදාල සීමාවන් දැක්වෙන වගුවෙහි"හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණ කාලසීමාව සහ වාහනයේ CIF වටිනාකම " සඳහන් තීරය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

| ප්‍රේෂණ වල වටිනාකම (ඇ.ඩො.) | වාහන වර්ගය | **හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණය කරන කාලසීමාව හා වාහනයේ CIF වටිනාකම** |
|---|---|---|
| 3,000 හෝ ඊට වැඩි | රෝද දෙකක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන (Motor Bicycle-HS Code - 8711) | 2022 මැයි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50%ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |
| 20,000 හෝ ඊට වැඩි | රෝද හතරක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන [ Motor Car - HS Code - 8703 Commercial Vehicle - HS Code - 8704 (Double Cab,Van,Tipper)] | 2022 මැයි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණයෙන් 50%ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |

**වගන්තිය 5- සම්පූර්ණ කළ යුතු නිර්ණායක**

**(3)** මෙහි **5.1** උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරනු ලැබේ.

"විද්‍යුත් වාහනයේ බැටරි ඇසුරුම සහ විදුලි මෝටරය සඳහා අවම වශයෙන් වසර 3 ක් සඳහාවත් නිෂ්පාදකයින්ගේ/ආනයනකරුවන්ගේ/අපනයනකරුවන්ගේ වගකීමක් තිබිය යුතු අතර ජාත්‍යන්තර විදුලි වාහන (EV) මාර්ග ආරක්ෂණ ප්‍රමිතීන් ද සපුරාලිය යුතුය. අනුමත/සම්මත ක්‍රියාපටිපාටි/ක්‍රමවේදවලට අනුකූලව, භාවිතා කළ බැටරිය බැහැර කිරීමේ වගකීම භාර ගන්නා බවට ආනයන / අපනයනකරුවන් විසින් සහතිකයක් ලබා දිය යුතුය".

(4) මෙහි **5.3** උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරනු ලැබේ.

"පාවිච්චි නොකල විද්‍යුත් වාහනයක් (Brand New) හෝ ධාවන මනුව ශූන්‍ය (New) වියයුතු අතර විද්‍යුත් වාහනය නිෂ්පාදිත රටේ පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ඇතුලත ශ්‍රී ලංකාවට ආනයනය විය යුතුය".

**වගන්තිය 6. මෙහෙයුම් ක්‍රමවේදය**

(5) මෙහි **6.3** උප වගන්තිය අවසානයට පහත සඳහන් යෙදුමද ඇතුලත් කෙරේ.

"මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන බලපත්‍රයක් නිකුත් කිරීමේ තීරක බලය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සතු වේ".

(6) **වගන්ති 8** ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.

"චක්‍රලේඛයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක +94 112 582 447 ඔස්සේ මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) හෝ දුරකථන අංක +94 112 368 175/ +94 773 039 034 ඔස්සේ ප්‍රබෝධ කහගොඩ ආරච්චි මහතා විමසිය හැකිවේ".

ආර්.පී .ඒ. විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය